කො/දේවි බාලිකා විද්‍යාලය

පළමු වාර පරීක්ෂණය - 2014

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

11 ශ්‍රේණිය　　　　　　　　　　　　　　　　කාලය පැය 02

01. පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් වාක්‍ය නිවැරදි කර ලියන්න.
   - ආ) ඇතමෙකු ප්‍රීතියෙන් ඔල්වරසන් දෙති
   - ආ) මිනිස්සු ධාර්මික ව වැඩ කරතියි අපි සිතුවෙමි

2. පහත දැක්වෙන පදයන්හි පිළි හඳුන්වන්න.
   - ආ) ටිකිරි
   - ආ) හුණු

3. පහත පදවලට අනුරූප විරුද්ධ පද ලියන්න.
   - ආ) න්‍යායික
   - ආ) ප්‍රවීණ

4. පහත සඳහන් පදවල අරුත් ලියන්න.
   - ආ) අසාරුප්පය
   - ආ) කෙසිවිත්

5. තදකළු අකුරින් යුත් පදවලට අදාල වන්නාවූ වියරණ විධිය වෙන වෙනම ලියන්න.
   - ආ) පුරාණ පඬිවරු පන්හිඳෙන් අකුරු ලියූහ.
   - ආ) දෙවියන් වැනි මිනිසුන් අප අතර වෙයි.

6. පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
   - ආ) ලේඛිකාවක් තම කෘතිය පිළිබඳව පාඨකයන් දැනුවත් කළාය.
   - ආ) අප සම්භාව්‍ය සාහිත්‍ය කෘති පරිශීලනය කරමු.

7. 
   - ආ) ලිපිකරුවා යන පදයෙහි අනියමාර්ථ ඒකවචන අනුක්ත නාම පදය ලියන්න.
   - ආ) "කඩති" යන ක්‍රියාවෙහි කර්මකාරක වර්තමාන කාල ක්‍රියාපදය ලියන්න.

8. පහත සඳහන් පද විසන්ධි කොට සන්ධි විධිය නම් කරන්න.
   - ආ) මැණිකක්
   - ආ) හංසයෝ

The National e-learning Portal for The General Education

13

9. පහත වචන සඳහා කමත් භාෂාවේ යෙදෙන වචන ලියන්න.

අ) කුඹුරේ වී මැනීම

ආ) පැදුරු

10. පහත සඳහන් ඉඟිවැකිවලට ගැලපෙන අරුත් ලියන්න.

අ) බත්පතේ වැලි දැමීම

ආ) දවල් මිගෙල් රෑ දනියෙල්

(02) පහත සඳහන් තේමා අතරින් ඔබ කැමති මාතෘකාවක් තෝරාගෙන වචන 250 කට නො අඩු රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක්ද යොදන්න.

අ) පොදු ප්‍රවාහන සේවයේ දක්නට ලැබෙන දුර්වලතාව නිසා මහජනතාවට දැඩි අපහසුතාවලට මුහුණ පෑමට සිදුව ඇත. රියදුරන්ගේ නොසැලකිල්ල නිසා ජීවිතහානි සිදුවීම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. මේ තත්වය මඟ හැරීමටත් පොදුජන හිතකාමී ප්‍රවාහන සේවයක් ඇති කිරීමටත් ගත හැකි ක්‍රියාමාර්ග.

ආ) රටක සංවර්ධනය සඳහා අධ්‍යාපනය අත්‍යවශ්‍යය. හැකියාවන් හා ශක්තීන් පුද්ගලයන් තුළ වර්ධනය කළ යුතුය. හුදෙක් කරුණු රාශියක් හිස තුළ රැඳවීම අධ්‍යාපනය නොවේ. විභාග සමත් වන්නගේ සංඛ්‍යාව ඉහළයාම රටකට වාසනාවක් එහෙත් අධ්‍යාපන ආයතනවලින් හා පාසල් වලින් බිහිවන්නන් රටට බරක් නොවිය යුතුය.

ඇ) වර්තමාන ලෝක ආර්ථිකය කඩා වැටීමකට ලක්වෙමින් පවතී. ලෝක මහා බලවතා වූ ඇමරිකාවෙන් පවා විරැකියාවෙන් පෙළෙන්නන්, මහා පරිමාණ ව්‍යාපාර කඩා වැටීම් ගැන අසන්නට ලැබේ. මේ ගැටලුව හමුවේ ලංකාව වැනි ආසියාතික රටක් නැඟී සිටීමට මුල් වන්නේ කෘෂි ආර්ථිකයක යැපීම නිසයි. අතීතයේ පැවැති ස්වයංපෝෂිත ආර්ථික රටාව නැවත ඇතිකර ගැනීම සඳහා කෘෂිකර්මාන්තය ඔස්සේ නවමංපෙත් සෙවීම අවශ්‍ය වී ඇත.

ඊ) වසර ගණනාවක් තිස්සේ මාවතේ ගමන් ගත් අයට සෙවණ දුන් දැවැන්ත නුග ගසකි මීට දින දෙකකට පෙර එහි අතු සියල්ල කපා බිම හෙළා ඇත. ගස් කඳෙහි අතු කැපූ තැන්වලින් ජල බිඳු බේරී වැටෙන බව මඟ ගමන් කරන්න වුනට දැක ගත හැකිය.

(03) පහත දැක්වෙන පාඨය වචන 40-45 අතර සංඛ්‍යාවකින් යුක්ත වනසේ සාරාංශ කොට ලියන්න.

සුවිසල් ගැඹුරු පුළුල් සාහිත්‍යයකින් පරිපූර්ණ සංස්කෘතික භාෂාව ගැන ද කිව යුත්තේ පූර්ණ ශබ්ද කෝෂයකින් හා ලොවටම පූර්වාදර්ශ වූ ව්‍යාකරණ සම්ප්‍රදායකින් ප්‍රතිමණ්ඩිත වූවක් ලෙසය. කථා ව්‍යවහාරයෙහි නැති භාෂා මිය ගිය භාෂා ලෙස සැලකීමේ ප්‍රවණතාව පිළිගැනීමට ඉඩක් නැත්තේ ඕනෑම විෂයයක් සාහිත්‍යයක් ලිඛිතව පවත්නා සවිස්තර පරිපූර්ණ සිළුටු වාග් කෝෂයට හිමිකම් ඇති අඛණ්ඩ ඉතිහාසයක් ඇති භාෂා අතරට පෙළ ගැසෙන ඒවා බවට පත් වන හෙයිනි. මේ ආකාර භාෂා ස්ථිර භාෂා යයි සැලකීම යුක්ති යුක්තය. එසේ සලකන්නේ එක්වර ස්වභාවයෙන් නොසැලී තිරසාර ව පවත්නා හෙයිනි. භාෂාව සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වන සාහිත්‍යය කෙරේ භාෂා ප්‍රේමීන්ගේ හා සාහිත්‍ය ධරයන්ගේ නිසි අවධානය යොමු වන්නේ සාහිත්‍ය සංස්කෘතියේ සභ්‍යත්වයේ හා ශිෂ්ටාචාරයේ ඒවා සුවිශේෂ අංග ලක්ෂණ වන හෙයිනි.

(04) පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා අකමැතිය සිරවී ඉදිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙහි
ඔහු යොදනවා නිදහස ගැන සෙව්ල්ලෙහි

මව්පිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජ මුතුව
පැටවගේ දෙනෙත පවති කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට නැතිව

දවසට සියවිටක් මව්පිය දෙදෙන විසින්
කටටම හෙළන මුත් ආහාර කුරුලු රසින්
පිටවන තුරා ඔහු සිරවී සිටින ගසින්
ඉගිලෙන සිහින පිටමං කළ නොහැක සිතින්

බිය සැක එමට ඇතිමුත් එළිමහන් තෙරේ
පැටවා දකී එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවිද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැතිව සැපතක් ඇතිවිය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුව හරි දුකෙක
බිය සැක දිගේ යන දිගු මාවත මිසෙක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

1. මෙහි කියවෙන කුරුලු පැටවාගේ ඇස් රතුවීමට හේතුව කුමක්ද ?
2. මෙහි කියවෙන පරිදි බාහිර ලෝකය ගැන කුරුලු පැටවාට ඇති වූ සිතුවිලි මොනවාද ?
3. මේ කුරුලු පැටවාට දෙමාපිය රැකවරණය නොඅඩුව ලැබෙන බව කියවෙන අවස්ථා උපුටා දක්වන්න.
4. නිදහස ගැන කවියා ඉදිරිපත් කරන අදහස ඔබේ වචනයෙන් ලියන්න.
5. පහත සඳහන් පදවලට සමාන පද කවිපන්තියෙන් තෝරා ලියන්න.
   1) නුඹ
   2) ස්වප්න

(05) තමන්ගේ ගෙවතුවලින් බැහැර කරන කුණු කසල මාර්ගය දෙපස එක්රැස් කිරීමෙන් වලකින ලෙස ඉල්ලා සිටිමින් පිළියන්දල කැස්බෑව ප්‍රාදේශීය සභාවේ මහජන පරීක්ෂක නිලධාරීවරයා විසින් ගම්මුන්ට බෙදා දීම පිණිස සකස් කරන ලද අත්පත්‍රිකාවක් සාදන්න. ඔබ ප්‍රාදේශීය සභාවේ සභාපතියයි සිතන්න.

හෝ

විද්‍යාලයේ පැවැත්වීමට බලාපොරොත්තු වන කලා උළෙල 2015.03.03 වන දින පැවැත්වීමට නියමිතය. එයට යෝග්‍ය න්‍යාය පත්‍රය පිළියෙල කරන්න.